මගේ අංකය - ඊටී/1(6) අභ්‍යා.උසස් - ජෙ.ත.සේ.නි.

ජාතික තරුණ සේවා සභාවේ සියලුම කාර්ය මණ්ඩලය වෙත,

**<u>ජාතික තරුණ සේවා සභාවේ පුරප්පාඩුව පවතින ජ්‍යෙෂ්ඨ තරුණ සේවා නිලධාරි (දිස්ත්‍රික්) තනතුර සඳහා අයදුම්පත් කැඳවීම.</u>**

ජාතික තරුණ සේවා සභාවේ පුරප්පාඩුව පවතින ජ්‍යෙෂ්ඨ තරුණ සේවා නිලධාරි (දිස්ත්‍රික්) තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති අයගෙන් 2022.12.12 දිනැති අභ්‍යන්තරික දැන්වීම මගින් අයදුම්පත් කැඳවන ලදි. එම අභ්‍යන්තරික දැන්වීමෙහි ඇමුණුම අංක 02 මගින් දක්වා තිබූ ලිඛිත තරඟ විභාගය අවලංගු කරනු ලබන බව දන්වා සිටිමි.

මගේ අංක - ඊටී/1(6) අභ්‍යා.උසස් - ජෙ.ත.සේ.නි. හා 2022.12.12 දිනැති දැන්වීමට අනුව නියමිත දිනට අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිළධාරින්ගේ අයදුම්පත් භාර ගනු ලබන අතර, එම අයදුම්පත් කැඳවීමේ දී අයදුම්පත් ඉදිරිපත් කිරීමට නොහැකි වූ නිළධාරින් පමණක් **ඇමුණුම් අංක 01** හි දක්වා ඇති සුදුසුකම් සපුරා ඇතිනම් අයදුම්පත් ඉදිරිපත් කල හැක.

ඒ අනුව අයදුම්කරුවන් පහත **ඇමුණුම් අංක - 02** ආකෘතියේ දැක්වෙන පරිදි සකස් කල අයදුම්පත තම ආසන්නතම අධීක්ෂණ නිළධාරියාගේ නිර්දේශ සහිතව 2023.05.22 දින හෝ එදිනට පෙර ප්‍රධාන කාර්යාලයේ මානව සම්පත් කළමනාකරණ අංශය වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාරදිය යුතු අතර, එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. මෙම උසස්වීම් සම්බන්ධයෙන් කිසියම් ආකාරයක බලපෑමක්, පෙළඹවීමක් සිදුකිරීම තනතුරු සඳහා තෝරාගැනීමට නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

- පුරප්පාඩුව පවතින තනතුරු

| අනු අංකය | තනතුර | වැටුප් කේතය | පුරප්පාඩු |
|---|---|---|---|
| 1. | ජ්‍යෙෂ්ඨ තරුණ සේවා නිලධාරි (දිස්ත්‍රික්) | JM 1-1 | 24 |

- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය - 2023.05. 22

පසිඳු ගුණරත්න,
සභාපති / අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික තරුණ සේවා සභාව.
2023.05.08 දින

ඇමුණුම 01

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්</u>**

ජ්‍යෙෂ්ඨ තරුණ සේවා නිලධාරි (දිස්ත්‍රික්)

ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ (MA -3) තරුණ සේවා නිලධාරි තනතුරෙහි අවම වහයෙන් වසර පහක (05) තරුණ සේවා කටයුතු පිළිබඳ ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයේ, II වන ශ්‍රේණියේ සහකාර තරුණ සේවා නිලධාරී තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක අදාළ ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයේ, තරුණ සේවා නිලධාරි II වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර (05) ක අදාළ ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

<u>සටහන:</u>
මේ සඳහා බඳවා ගනු ලබන්නේ සහකාර තරුණ සේවා නිලධාරි / තරුණ සේවා නිලධාරි තනතුරේ සේවය කරන නිලධාරින් පමණි. බාහිර බඳවා ගැනීම් සිදු කරනු නොලැබේ.

- JM 1-1 සේවා ගණයට අයත් වැටුප්

JM 1-1 – 02/2016: රු.42,600 – 10 X 755 – 18 X 1135 - 70,580/-

- 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධාන අනුව පත්වීම් ලබන දින සිට ඉහත වැටුප් පරිමාණයට හිමිකම් ලබන අතර, තනතුරට අදාලව රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය - **2023.05. 22**

ඇමුණුම් අංක - 03

සේ:අ:අංකය:-

<u>ආදර්ශ අයදුම් පත්‍රය</u>

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

අයදුම්කරන තනතුර:- ..................................................

<u>ජාතික තරුණ සේවා සභාවේ ඇබෑර්තුව පවතින පෝෂ්‍ය තරුණ සේවා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම</u>

**01.**

1.1. අයදුම්කරුගේ මුලකරු සමග නම :- ..................................................

1.2. සම්පූර්ණ නම : - ..................................................

1.3. ජාතික හැඳුනුම්පත් අංකය -

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

1.4. ස්ත්‍රී / පුරුෂ භාවය :- ස්ත්‍රී ☐ පුරුෂ ☐

1.5. සේවා ස්ථානය :- ..................................................

**02.**

2.1. ස්ථිර ලිපිනය :- ..................................................

2.2. දුරකථන අංකය :-

**03.** ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම්:-..................................

3.1. වෘත්තීය සුදුසුකම් :-

| පාඨමාලාවේ නම | නිපුණතා මට්ටම | ආයතනය |
|---|---|---|
| | | |

04. ඔබ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකට දඬුවම් ලැබ තිබේද ? (අදාල කොටුවේ ( √ ) ලකුණ යොදන්න)

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

එසේ දඬුවම් ලැබ ඇත්නම්, ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින් කවර දඬුවමක් ලැබ ඇති ද යන තොරතුරු සපයන්න :- ..........................................................................................................

05. අ.යදුම්කරුගේ සහතිකය:-

(අ) . මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි අලාභය විඳ දරා ගැනීමට මම එකඟ වෙමි. තවද මෙහි සියළුම තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) . මවිසින් කරන ලද මෙම ප්‍රකාශනය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්වීම ලැබීමට නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසුව වුව ද තනතුරෙන් ඉවත්කිරීමට යටත් වන බවත් මම දනිමි.

(ඇ). මෙහි සඳහන් කිසිඳු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

.....................................

දිනය :- .....................................

අයදුම්කරුගේ අත්සන

06. ආසන්නතම අධීක්ෂණ නිළධාරියාගේ නිර්දේශය:-

............................................ සේවයේ නියුතු ......................................................................... මයා/මිය/මෙනවිය....................................තනතුර දරණ නිළධාරියෙකු බවත්, ඔහු/ඇය/ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. එසේම ඔහු/ඇයගේ රාජකාරී විනය/හැසිරීම හා පැමිණීම යහපත්/අයහපත් බව නිර්දේශ කරමි.

.........................................................

අත්සන හා නිළ මුද්‍රාව

නම :-.........................................

තනතුර :-.........................................

දිනය :-.........................................